රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය
පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

ECN 4103 – පාරිසරික ආර්ථික විද්‍යාව

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

කාලය : පැය 03

---

01. (අ) පරිසරය හා ආර්ථිකය අතර පවත්නා සම්බන්ධතාවයේ මූලික ප්‍රපංචයන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) පරිසර සම්පත් වර්ගීකරණයේ මූලිකාංග මොනවාද? සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ඇ) යම්කිසි ආර්ථික පද්ධතියක ධාරිතාවය ඉහළ යාම හා ක්‍රියාකාරිත්වය වැඩිවීම යන්නෙන් කුමක් අදහස් වේද? මෙම තත්ත්වය පරිසර සම්පත් සඳහා බලපාන ආකාරය උදාහරණ ඇසුරින් පහදන්න.

(ලකුණු 08)

02. (අ) ස්වභාවික සම්පත් ආශ්‍රිතව වෙළෙඳපොළ අසමත් වීමක් (Market Failure) සිදුවීමට බලපාන හේතු මොනවාද?

(ලකුණු 05)

(ආ) බාහිරතාවයන් (Externalities) යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි පහදමින් අවකාශීය බාහිරතාවයන් (Spatial Externalities) සහ කාලීන බලපෑම් සහිත බාහිරතාවයන් (Temporal Externalities) අතර වෙනස කෙටියෙන් පහදන්න.

(ලකුණු 07)

(ඇ) බාහිරතා අවම කිරීම සඳහා ගතහැකි විසඳුම් හා ක්‍රියාමාර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

03. (අ) පරිසර සම්පතක පූර්ණ ආර්ථික වටිනාකම (Total Economic Value) යන්නෙන් ඔබ කුමක් අදහස් කරන්නේද?

(ලකුණු 05)

(ආ) "පරිසර සම්පතක වටිනාකම තක්සේරු කිරීමේදී ඒවා වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය සමඟ පවතින සම්බන්ධතාවය අනුව තක්සේරු කල හැකිය." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 07)

(ඇ) නිෂ්පාදිතය වෙනස් වීම ඇසුරින් වටිනාකම මැනීමේ (Productive Change Method) ප්‍රවේශය, හෙඩොනික් මිල ඇසුරෙන් වටිනාකම මැනීමේ (Hedonic Price Approach) ප්‍රවේශයෙන් වෙනස් වන ආකාරය සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

04. (අ) පරිසර ප්‍රතිපත්ති සම්පාදනයේදී දායක වන ප්‍රධාන පාර්ශවයන් මොනවාද? සුදුසු එක් උදාහරණයක් ඇසුරෙන් මෙම පාර්ශවයන් අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට කරනු ලබන දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 05)

(ආ) වෙළෙඳපොළ මත පදනම් වූ පරිසර පතිපත්ති සම්පාදනයේදී බහුලව භාවිතා කරන ප්‍රමිති වර්ගයන් පෙන්වා දෙමින් එවැනි ප්‍රමිති සකස් කිරීමේදී මූලිකවම සලකා බලන සාධක මොනවා දැයි විස්තර කරන්න.

(ලකුණු 07)

(ඇ) "ගෝලීය උණුසුම ඉහළ යාම වර්තමාන ලෝකය මුහුණ දෙන ප්‍රධාන පරිසර අභියෝගයක් වී ඇත." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස පාරිසරික, සාමාජීය හා ආර්ථික අංශ ඔස්සේ අවධානය යොමු කරමින් විග්‍රහ කරන්න.

(ලකුණු 08)

05. (අ) ස්වභාවික සම්පත් කළමනාකරණය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? මෙම ස්වභාවික සම්පත් කළමනාකරණයේ පවතින සීමාවන් මොනවාද?

(ලකුණු 05)

(ආ) සුදුසු උදාහරණ භාවිතා කරමින් ස්වභාවික සම්පත් කළමනාකරණයේදී සම්පත් කළමණාකරුවන්ගේ භූමිකාව හඳුන්වා දෙමින් සංකීර්ණ කළමනාකරණ තත්ත්වයක් බිහිවීමට බලපාන හේතු සඳහන් කරන්න.

(ලකුණු 07)

(ඇ) ස්වභාවික සම්පත් කළමනාකරණයේදී අවිනිශ්චිතතාවය (Uncertainty) මඟින් ඇති කරනු ලබන බලපෑම උදාහරණ ඇසුරින් පහදන්න.

(ලකුණු 08)

06. (අ) පරිසරය හා දුගීභාවය අතර පවත්නා අන්තර් සබඳතාවය විස්තර කරන්න.

(ලකුණු 05)

(ආ) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට අමතරව වර්තමාන ලෝකයේ රටවල් මුහුණ පාන ප්‍රධාන පාරිසරික ගැටලු පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් කරන්න.

(ලකුණු 07)

(ඇ) පාරිසරික සංවර්ධනය, දිළිඳුකම පිටුදැකීම හා මහජනයාගේ යහපැවැත්ම අරමුණු කර ගනිමින් වර්තමාන ලෝකය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ලකුණු 08)

07. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) ගමන් වියදම් ඇසුරින් වටිනාකම් මැනීමේ ක්‍රමවේදය (Travel Cost Valuation Method)

(ආ) මානව ප්‍රාග්ධනය ඇසුරින් වටිනාකම් මැනීමේ ක්‍රමවේදය (Human Capital Valuation Method)

(ඇ) රියෝ ප්‍රකාශය සහ 21 වන සියවසේ න්‍යාය පත්‍රය (Rio Declaration and Agenda 21)

(ඈ) 1997 කියෝටො පිළිවෙත (Kyoto Protocol, 1997)

(එක් කොටසකට ලකුණු 05 බැගිනි.)

@@@@@@@



68